**අත්තනගල්ල ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

**නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සැපයුම් ගිණුමවලට හර කරන ලද ලිපි ද්‍රව්‍ය, සෞඛ්‍ය ද්‍රව්‍ය, තැලීම් ද්‍රව්‍ය සහ ආයුර්වේද ද්‍රව්‍ය ගැනුම් නැවත අදාළ තොග ගිණුම වලට හර කර තිබුනද, එම වටිනාකම් අතර රු.9,685,894 ක වෙනසක් සහ වර්ෂය තුළ පරිභෝජනය කළ සැපයුම් වටිනාකම සහ විස්තීර්ණ වියදම අතර රු.9,681,947 ක වෙනසක් විය. | 2023 වර්ෂයේ සිට වෙනම ගබඩා ණය හිමි ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | වෙනස් කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

## 1.7. අනුකූල නොවීම්

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන ආඥා පනතේ වගන්ති අංක 20 | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 5 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා කරවා ගතයුතු වුවද උප කාර්යාල 2 ක වසර 14 කට පෙරදී කරන ලද වරිපනම් තක්සේරුව මත බදු අයකර තිබුණි. | තක්සේරුව යාවත්කාලීන කර ගැනීම සඳහා දැනුම් දුන්නද තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මෙතෙක් අවකාශ ලැබී නොමැති බව. | නව වරිපනම් රේට අනුව වරිපනම් අයකළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි | | | |
| | 571(i) | 2004 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලයේදී තැන්පත් කරනලද, වසර 2 ඉක්ම වූ වටිනාකම රු.3,060,982 ක් වූ තැන්පතු නියාදනය කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | වසර 2 ඉක්මවූ තැන්පතු නියාදනය කළ යුතුය. |
| (ඇ) | 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු (බස්නාහිර පළාත) චක්‍රලේඛය | තක්සේරුව ගිවිසගත් දිනෙන් සෑම වසර 03 කට වරක් ප්‍රතිශෝධනය කල යුතු වුවත් කඩ කාමර 10 ක් 2014 වර්ෂයේද, කඩ කාමර 5 ක් 2009 වර්ෂයේද, අවසන් වරට ප්‍රතිශෝධනය කර තිබුණි. | කඩකාමර 10 ක ගිවිසුම් අනුව වසර 05 කට වරක් අළුත් කල යුතු බැවින් එය 2019 වර්ෂයේදි කල යුතුය. එම කඩ තක්සේරුව සඳහා ඉල්ලුම් කර ඇති බව. | තක්සේරුව කරවාගෙන නව රේට අනුව කුලී අයකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.59,614,955 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.76,585,446 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 32,702,400 | 34,204,457 | 32,884,417 | 30,661,387 | 28,949,731 | 34,634,478 | 33,245,678 | 31,359,741 |
| (ii) | කුලී | 12,432,745 | 39,188,773 | 31,229,555 | 38,381,665 | 17,708,241 | 17,728,466 | 15,505,896 | 5,931,626 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,583,000 | 1,597,976 | 1,597,976 | - | 1,241,500 | 1,171,100 | 1,171,100 | - |
| (iv) | වෙනත් ආදායම් | 362,839,798 | 318,695,105 | 354,025,698 | 74,143,644 | 417,210,180 | 376,418,380 | 316,230,489 | 325,650,119 |
| | | 409,557,943 | 393,686,311 | 419,737,646 | 143,186,696 | 465,109,652 | 429,952,424 | 366,153,163 | 362,941,486 |

#### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු**<br>2022 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් වටිනාකම රු.30,135,039 ක් තුල අයවිය යුතු කාලය වර්ෂ 10 ට වැඩි වටිනාකම රු.6,329,071 ක්ද, වර්ෂ 5 ත් 10 ත් අතර වටිනාකම රු.8,690,067 ක්ද, වර්ෂ 3 ත් 5 ත් අතර වටිනාකම රු.6,623,024 ක්ද විය | ක්‍රමානුකූලව පරික්ෂා කර ඉවත් කිරීම්, දේපල තහනම් කිරීම්, ජංගම සේවා, ගෙයින් ගෙට යෑම් රතු නිවේදන බෙදීම් ආදිය ක්‍රියාත්මක වන බව. | පනතේ විධි විධාන අනුව හිඟහිටි වරිපනම් අය කළ යුතුය. |
| (ආ) | **කුලී**<br>2022 දෙසැම්බර් 31 දිනට හිග කඩ කුලී ශේෂය රු.37,331,243 ක් තුළ අයවිය යුතු කාලය වර්ෂ 5 ත් 10 ත් අතර රු.725,710 ක්ද, වර්ෂ 3 ත් 5 ත් අතර රු.19,289,340 ක් ද විය. | නව තක්සේරුවට නඩුවක් විභාග වන අතර කඩ කාමර 07 ක කුලිය කපා හැරීමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් අනුව හිග කඩ කුලී අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ සභාවට ලද මහජන පැමිණිලි 464 න් ප්‍රතිශතය සියයට 48 ක් වූ පැමිණිලි 223 ක් සඳහා 2023 මැයි 19 දින වන විට විසඳුම් ලබාදී නොතිබුණි. | පරික්ෂා කර ක්‍රියාත්මක වෙමින් පවතින බව. | මහජන පැමිණිලි විසඳිය යුතුය. |

## 3.2. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 39/980 දරන ඉඩම් නඩුකරයේ තීන්දුව ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2019 මැයි 15 දින රු.1,876,800 ක මුදලක් සහා අරමුදලින් නඩුවේ පැමිණිලිකාර පාර්ශවයට ගෙවා තිබුණද වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර නොතිබුණි | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ලද පරීක්ෂණ වාර්තාව අනුව වගඋත්තරකරුවන් වන මහජන නියෝජිතයින් හා නිලධාරීන්ට ගෙවන ලෙස දැනුම් දී ඇත.මහජන නියෝජිතයින්ට විධිමත් අධිහාර ලිපියක් ලැබී නොමැති බැවින්, ගෙවීම් නොකරන බව | අලාභය අයකර ගත යුතුය . |

## 3.3. සේවක ණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ 2022 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟහිටව පවතින නිලධාරීන් 03 දෙනෙකුගේ ණය ශේෂය රු.138,187 ක් 2023 මැයි 19 දින වන විටත් අයකර නොතිබුණි. | තොරතුරු සොයමින් පවතින බව. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය . |